**නියාගම ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**
**--------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**------------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 අප්‍රේල් 06 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 22 ද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජුනි 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
------------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට නියාගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
---------------------------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
**----------------------------**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දී ඉඩම් හා ගොඩනැගිලි වැඩිදියුණු කිරීම වෙනුවෙන් දැරූ වියදම් රු.1,503,338 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදි ප්‍රමාණයෙන් ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | 2019 වර්ෂයේ මිලට ගත් යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වටිනාකම රු.31,433 ක් වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි. | නිවැරදි ශේෂයන් ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ශේෂය තුළ රු.324,541 ක් වූ ස්ථාවර වත්කම් නොවන අයිතමයක අගයක් ගිණුම් ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (ඇ) | සභාවේ නිලධාරීන් 15 දෙනෙකුගෙන් අයකර ගත් සේවක ඇප තැන්පතු රු.70,500 ක් ගිණුම් ගතකර නොතිබුණි. | සේවක ඇප තැන්පතු නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඉ) | අවුරුදු උත්සව සඳහා දරන ලද අයභාර වියදම් රු.49,673 ක් ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම් ගතකර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.3.2 නොසැසඳුනු ගිණුම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 03 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන / උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.5,835,675 ක වෙනසක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | කාලයක සිට පවතින අසමාන - තාවයන් බැවින් ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය හා ස්ථාවර වත්කම් ගිණුමේ ශේෂය අතර රු.38,678 ක වෙනසක් විය. | ගිණුම් සසඳා නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**(අ) ලැබිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දිගු කාලයක සිට අය නොවී පවතින රු.5,121,192 ක ණයගැති ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු ගිණුම් ශේෂ අයකර කරගත යුතුවේ. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරමි. |

**(ආ) ගෙවිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ඉකුත් වර්ෂයන්ට අදාල එකතුව රු.13,645,590 ක් වූ ණයහිමි ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගෙවිය යුතු ගිණුම් ශේෂ පියවීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කරමි. |

**1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

**තොරතුරු ඉදිරිපත් නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| රු.144,685,876 ක් වූ ගිණුම් විෂයයන් 08 ක් සඳහා අවශ්‍ය තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.4 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| **(අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති** | | | |
| (i) රීති 33 | වරිපනම් බදු ගෙවීම් පැහැර හැර ඇති පුද්ගලයින් පිළිබඳ ලැයිස්තු සහ දේපල තහනම් කිරීමේ වරෙන්තු ලැයිස්තු පිළියෙල කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී වරෙන්තු නිකුත් කර, හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ii) රීති 193 | අයවැය සමඟ අය හා වැය විෂයයන් සසඳා අතිරික්තතා හා ඌණතාවලට හේතු දැක්වෙන | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී එවැනි ප්‍රකාශයක් ඉදිරිපත් කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| | | ප්‍රකාශනයන් පිළියෙල කර නොතිබුණි. | | |
| | (iii) රීති 218 | සභාව සතු ඉඩම් සෑම වර්ෂයකට වරක් හෝ පරීක්ෂා කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී යථා පරිදි කටයුතු කරමි. |
| **(ආ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි**<br>---------------------- | | | |
| | මුදල් රෙගුලාසි 571 | වසර 02 ක් ඉක්ම වූ රු.10,978,734 ක තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී කල් ඉකුත් වූ තැන්පතු ආදායමට ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 චක්‍රලේඛය | සභාව වාහන 10 ක ඉන්ධන දහන පරීක්ෂාව කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | චක්‍රලේඛ ප්‍රකාරව ඉදිරියේදී කටයුතු කරමි. |

## 2 මූල්‍ය සමාලෝචනය

---------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-----------------

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.6,544,603 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,435,277 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

------------------

| **විගණන නිරීක්ෂණය**<br>----------------------------- | **නිර්දේශය**<br>------------- | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම**<br>----------------- |
|---|---|---|
| 2017 හා 2018 වර්ෂවල පිළිවෙලින් පැවැති රු.27,450,427 ක් හා රු.7,470,678 ක සමුච්චිත අරමුදල් ගිණුමේ හර ශේෂ සමාලෝචිත වර්ෂය අවසාන වනවිට රු.7,384,375 ක් විය. මේ අනුව සමුච්චිත අරමුදල් ගිණුමේ හර ශේෂයන් පැවැතීම යහපත් මූල්‍ය පාලනයක ලක්ෂණයක් නොවීය. | කාරක ප්‍රාග්ධනය වර්ධනය කර, සමුච්චිත අරමුදල යහපත් කරගත යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |

## 2.3 ආදායම් පරිපාලනය

**ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 901,603 | 653,613 | 689,213 | 340,334 | 1,419,850 | 1,461,880 | 1,746,829 | 375,934 |
| කුලී | 4,167,056 | 4,590,297 | 3,881,070 | 1,130,970 | 5,690,850 | 4,620,375 | 4,969,716 | 402,274 |
| බලපත්‍ර ගාස්තු | 314,026 | 270,334 | 279,084 | - | 310,625 | 419,286 | 421,411 | - |
| | 5,382,685 | 5,514,244 | 4,849,367 | 1,471,304 | 7,421,325 | 6,501,541 | 7,137,956 | 778,208 |

### 2.3.1 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.2,722,817 ක් හා මුද්දර ගාස්තු රු.5,748,014 ක් විය. | උසාවි දඩ හා මුද්දර ගාස්තු ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | අයවිය යුතු මුදල් ලබාදෙන ලෙස ප්‍රධාන ලේකම්වරයාට ලිපි යවා ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) **ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පනවා තිබුණ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු වේ. | ඉදිරියේ දී වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරමි. |

(ආ) **ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කසළ කළමනාකරණය සම්බන්ධ විධිමත් සැලසුමක් සභාව සතුව නොතිබුණි. | කසළ බැහැර කිරීම සඳහා විධිමත් හා දීර්ඝකාලීන වැඩපිළිවෙලක් සකස් කල යුතුවේ. | රජයේ ඉඩමක් ලබා ගැනීම සඳහා කටයුතු කරන අතර, දීර්ඝකාලීන වැඩපිළිවෙලක් සකස් කරමි. |

(ඇ) **තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ, තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සහා බලප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නැංවීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන සඳහා වන දීර්ඝකාලීන සැලසුම් සකස් කර ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවිය යුතුවේ. | බල ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවීමට ඉදිරියේ දී සැලැස්මක් සකස් කරමි. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වීථි පහන් නඩත්තු කිරීම වෙනුවෙන් විදුලිබල මණ්ඩලය සමඟ වාර්ෂිකව ගිවිසුම්වලට එළඹ නොතිබීමෙන් වීථි පහන් නඩත්තුව වෙනුවෙන් ලබාගත හැකිව තිබූ නඩත්තු මුදල් අයකරගත නොහැකි වී තිබුණි. | නඩත්තු කටයුතු කිරීම සහ නඩත්තු මුදල් අයකර ගත යුතුවේ. | ඉදිරියේදී ගිවිසුම්ගතවීමට කටයුතු කරමි. |
| (ආ) | සභාවේ ගල් රෝල කුලියට දීම විධිමත්ව සිදු කර නොතිබීම නිසා 2018 වර්ෂයට අදාළව රු.64,000 ක් හා 2019 වර්ෂයට අදාළව රු.60,000 ක් රියදුරුගෙන් අය කරගත යුතුව තිබුණි. | ගල් රෝල කුලියට දීම විධිමත්ව සිදුකල යුතුවේ. | ඉදිරියේ දී විධිමත් වැඩපිළිවෙලක් සකස් කරමි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අනුමත සේවක සංඛ්‍යාව තුල ඇතුලත් පුරප්පාඩු 10 ක් සම්පූර්ණ කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කරවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | ප.පා.දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර, පුරප්පාඩු බඳවා ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | 2019 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආදේශක සේවකයින් 06 දෙනෙකුට දෛනික වැටුප් වශයෙන් රු.738,661 ක් ගෙවා තිබුණි. | ආදේශක තනතුරු විධිමත් කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ප.පා.දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර, විධිමත් කර ගැනීමට කටයුතු කරමි. |

**4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණනය ශක්තිමත් කළ යුතුවේ. | ඉදිරියේ දී අභ්‍යන්තර විගණනයක් සිදුකර වාර්තා එවීමට කටයුතු කරමි. |

**4.2 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාර කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීමට කටයුතු කරමි. |